### රජයේ නිවේදන

## 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

### 3 ඇ වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් මෙම පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2021 අප්‍රේල් මස 05 දිනැති අංක 2222/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 2016 නොවැම්බර් මස 10 දිනැති අංක 1992/30 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ උපලේඛනයේ 9 වන වගන්තියට පසුව පහත නව වගන්තිය ඇතුළත් කරමින් සංශෝධනය කරමි.

"(10) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර කටයුතු සඳහා වතුර බවුසර් පනස් දෙකක් (52) සහ ඩබල් කැබ් රථ හැට දෙකක් (62) ආනයනය කිරීමට වන අංක 21/1140/304/094 හා 2021 ජූනි මස 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව වූ 2021 ජූනි මස 28 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය අනුව ආනයනය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8704.23.71 යටතේ වර්ගීකරණය කරනු ලබන වතුර බවුසරයක් හෝ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8704.21.91 යටතේ වර්ගීකරණය කරනු ලබන ඩබල් කැබ් රථයක්"

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 .:08.03.............. වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.